**ප්‍රසම්පාදන දැන්වීමයි**

**යටියන්තොට ප්‍රාදේශීය සභාව**

1.යටියන්තොට ප්‍රාදේශීය සභා බල ප්‍රෙද්ශය තුළ පිහිටි මේ සමග අමුණා ඇති උපලේඛනයේ දැක්වෙන පුරනැගුම වෙළඳ සංකීර්ණයේ අංක 02,03,04,09,10,12 (යටි යහල)කඩ කාමර 2023 වර්ෂයට බදු දීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පමණක් මා විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2.ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ උපලේඛනයේ දැක්වෙන ටෙන්ඩර් ඇප හා අයදුම්පත්‍ර ගාස්තු ගෙවීමෙන් පසු යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලබා ගත් ටෙන්ඩර් අයදුම්පත්‍ර මගිනි .ටෙන්ඩර් අයදුම් පත්‍ර නිකුත් කිරීම 2023.09.27 දින සිට 2023.10.11 දහවල් 12 දක්වා සිදු කරනු ලැබේ.

3.ටෙන්ඩර් භාර ගැනීම 2023.09.28-2023.10.12 දින පෙ.ව 10.00 දක්වා සිදු කරනු ලබන අතර 2023.10.12වන දින පෙ.ව 10.30 ට ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

4.විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත් මුල් පිටපත හා අනු පිටපත් වෙන් වෙන්ව බහා එවන කවරයේ වම් පස ටෙන්ඩරයේ නම පැහැදිලිව සටහන් කර සභාපති ,ප්‍රාදේශීය සභාව ,යටියන්තොට යන ලිපිනයට නියමිත දින නියමිත වේලාවට ලැබෙන සේ ලියාපදිංචි තැපැල මගින් එවිය යුතුය.නැතහොත් යටියන්තොට ප්‍රාදේශීය සභා කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ නියමිත වේලාවට පෙර ලැබෙන සේ තැන්පත් කළ යුතුය.ටෙන්ඩර් අයදුම්පත්‍රය සමඟ නිකුත් කරනු ලබන ටෙන්ඩර් කොන්දේසි පිළිගත් බවට අත්සන් කර මුල් පිටපත සමඟ අමුණා එවිය යුතුය.ටෙන්ඩර් පත්වන සියලු වෙනස් කිරීම් මකා දැමීම් ටෙන්ඩර්කරුගේ අත්සන් යොදා සනාථ කළ යුතුය.

5.පිළිගත් ටෙන්ඩර්කරු ටෙන්ඩර්පත් පිළිගත් බවට දැනුම් දුන් දින සිට දින 07 ක් ඇතුලත ගිවිසුමකට අත්සන් කළ යුතුය.මාසික කුලී පදනම මත තෝරාගත් ලංසු කරුවන් තුන් මසක කුලියට සමාන මුදලක් ඇප වශයෙන් තැන්පත් කල යුතු අතර දීර්ඝ කාලීන බදු පදනම මත තෝරාගත් ලංසු කරුවන් මාස 06 ක කුලියට සමාන මුදලක් ඇප වශයෙන් තැන්පත් කල යුතුය.ටෙන්ඩර් පිළිගැනීමේ හා ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය යටියන්තොට ප්‍රාදේශීය සභාවේ ටෙන්ඩර් මණ්ඩලය සතුවේ.

6.ටෙන්ඩර් ඇප ආපසු ගෙවනු ලබන්නේ පිළිගත් ටෙන්ඩර්කරු ගිවිසුම අත්සන් කිරීමෙන් පසුවය.ටෙන්ඩර් පෝරම ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

7.පිළිගත් ටෙන්ඩර්කරු ගිවිසුමේ සඳහන් සියලු කොන්දේසි පිළිපැදිය යුතු අතර ඒවා එකක් හෝ උල්ලංඝනය කළහොත් ඇප මුදල් සභාව සතු කර අයිතියද අවලංගු කරනු ලැබේ.

8.උපලේඛනයේ සඳහන් අවම ලංසුවට වඩා අඩුවෙන් ටෙන්ඩර් ඉදිරිපත් කරන අයගේද නියමිත වේලාවට ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන ටෙන්ඩර් කරුවන්ගේ හා ගිවිසුම අත්සන් කිරීමට නොපැමිණෙන අයගේද සියලුම ටෙන්ඩර් ඇප මුදල් සභාව සතු කර ගනු ලැබේ.


| සභාපති<br>தலைவர்<br>CHAIRMAN | 036-2271675 | කාර්යාලය<br>அலுவலகம்<br>OFFICE | 036-2270237 | ෆැක්ස්<br>பெக்ஸ்<br>FAX | 036-2270237 | විද්‍යුත් තැපැල<br>ஈ-மெயில்<br>e- mail | #yatiyantotaps@gmail.com |
|---|---|---|---|---|---|---|---|

9.යටියන්තොට ප්‍රාදේශිය සභාවට හිඟ තබා ඇති අසාදු ලේඛනයේ නම ඇතුළත් අයට ටෙන්ඩර් අයදුම්පත්‍ර නිකුත් කරනු නොලැබේ.

10.ටෙන්ඩර් විවෘත කරන වේලාවට ටෙන්ඩර් ඉදිරිපත් කරන අයට පැමිණීමට නොහැකි නම් පමණක් ලියවිල්ලකින් බලය පැවරූ ඔහුගේ නියෝජිතයෙකු සහභාගි කරවිය හැකිය.

11.රජය විසින් වරින් වර පනවනු ලබන බදු හා බදු ප්‍රතිශත වෙනස් කිරීම් වලට ටෙන්ඩර්කරු යටත් විය යුතුය.

12.මාසික කුලී පදනම මත තෝරාගත් ලංසුකරුවන්ගේ ආරක්ෂිත ඇප මුදල් අවසාන මාස 03(ඔක්තෝම්බර්,නොවැම්බර්,දෙසැම්බර් ) සඳහා හිලව් නොකරන අතර එම මාසයන්හිදී ද මාසික ගෙවිය යුතුය. මෙම නියමිත පැහැර හැරීම තමා විසින් තැන්පත් කළ ඇප මුදල් අහිමි වීමට හේතු වේ .

13.ටෙන්ඩර් කොන්දේසි හා වැඩි විස්තර යටියන්තොට ප්‍රාදේශිය සභා කාර්යාලයෙන් ලබා ගත හැකිය.

14.ඔබ විසින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී බදු ගැනීමට අපේක්ෂා කරන්නේ දීර්ඝ කාලීන පදනමින්ද වාර්ෂික පදනමින්ද යන්න නිශ්චිතව සඳහන් කල යුතුය.

15.කුමන හෝ කඩ කාමරයක් සඳහා දීර්ඝ කාලීන බදු පදනම හා මාසික කුලී පදනම යන අවස්ථා දෙකෙහිම මිල ගණන් ලැබී ඇති විටකදී දීර්ඝ කාලීන බදු පදනම යටතේ ඉදිරිපත් වී ඇති මිල ගණන් පමණක් සලකා බලනු ලැබේ.

16.මිල ගණන් පත් විවෘත කිරීම හෝ ප්‍රසම්පාදන තීරණය සම්බන්ධ අවසාන තීරණය ප්‍රසම්පාදන කමිටුව සතු වේ.

17.මිල ගණන් පත් විවෘත නොකරන අවස්ථාවක් වුවහොත් ආපසු නොගෙවන පෝරම ගාස්තුද ආපසු නිකුත් කරනු ලැබේ.

දුමින්ද සී වික්‍රමසිංහ
ලේකම්
යටියන්තොට ප්‍රාදේශිය සභාව
2023.09.28 .

දුමින්ද සී. වික්‍රමසිංහ
ලේකම්
සහකාර වැඩබලන. කාර්ය සාධක
ක්‍රියාත්මක කිරීමේ නිලධාරී
ප්‍රාදේශීය සභාව
යටියන්තොට

## යටියන්තොට ප්‍රාදේශීය සභාව

## ප්‍රසම්පාදන දැන්වීමයි

යටියන්තොට ප්‍රාදේශීය සභාවට අයත් අලුතින් ඉදිකළ පුරනැගුම වෙළඳ සංකීර්ණයේ පහත විස්තර කරන ස්ථාන දීර්ඝ කාලීන කුලී පදනම මත හෝ මාසික කුලී පදනම යටතේ (වර්ෂයක් සඳහා)බදු දීම සඳහා මා විසින් මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | දේපල විස්තරය (යටි මහල) | වර්ග අඩි | වෙළඳාම | දීර්ඝ කාලීන බදු පදනම මත | | මාසික කුලිය පදනම මත (රු.ශත) | ආපසු නොගෙවන පෝරම ගාස්තු (රු.ශත) | ආපසු ගෙවන තැන්පත් මුදල (රු.ශත) |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | මාසික කුලිය (රු.ශත) | අවම ලංසුව (රු.ශත) | | | |
| 01 | අංක 02 කඩ කාමරය | 225 | නීති විරෝධි වෙළඳාම් නොවන වෙනත් ඕනෑම වෙළඳාමක් සඳහා | 10,800.00 | 1,296,000.00 | 10,800.00 | 1,000.00 | 5,000.00 |
| 02 | අංක 03කඩ කාමරය | 225 | | 10,800.00 | 1,296,000.00 | 10,800.00 | 1,000.00 | 5,000.00 |
| 03 | අංක 04 කඩ කාමරය | 225 | | 10,800.00 | 1,296,000.00 | 10,800.00 | 1,000.00 | 5,000.00 |
| 04 | අංක 09 කඩ කාමරය | 112 | | 6,000.00 | 720,000.00 | 6,000.00 | 1,000.00 | 5,000.00 |
| 05 | අංක 10 කඩ කාමරය | 112 | | 6,000.00 | 720,000.00 | 6,000.00 | 1,000.00 | 5,000.00 |
| 06 | අංක 12 කඩ කාමරය | 122 | | 15,000.00 | 1,800,000.00 | 15,000.00 | 1,000.00 | 5,000.00 |

- ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම - 2023.09.27 -2023.10.11 දින ප.ව 12.00 දක්වා
- ටෙන්ඩර් භාර ගැනීම - 2023.09.28-2023.10.12 පෙ.ව.10.00
- ටෙන්ඩර් විවෘත කිරීම - 2023.10.12 පෙ.ව 10.30 ට.

ටෙන්ඩර් කොන්දේසි හා වැඩි විස්තර යටියන්තොට ප්‍රාදේශීය සභාවෙන් ලබා ගත හැකිය.

දුමින්ද් සී.වික්‍රමසිංහ

ලේකම්

යටියන්තොට ප්‍රාදේශීය සභාව

දුමින්ද සී. වික්‍රමසිංහ
ලේකම්
ප්‍රාදේශීය සභාව
යටියන්තොට